සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# දෙවන වාර පරීක්ෂණය 2018
# සිංහල සාහිත්‍ය රසාස්වාදය

**11 ශ්‍රේණිය** **කාලය පැය 03 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **I** කොටසෙහි 1, 2 ප්‍රශ්නවලටත්, **II** කොටසෙහි 3 වැනි ප්‍රශ්නයටත්, **III** කොටසෙහි 4, 5, 6, 7, ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.

## I කොටස

(1) (i) සිට (v) දක්වා කොටස් කියවා ඒවා ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) " තොප ගේ ස්වාමිපුත්‍රයාණන් දුටු දැයි"

(අ) මේ ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින්ද?

(ආ) මේ ආකාරයට විමසා සිටියේ කොතැන දී ද?

(ii) "ඩිංගිරිගෙන් බත් ඉල්ලගෙන කලා නිදාගන්න"

(අ) මේ පාඨය ඇතුළත්වන නිර්මාණය උපුටාගත් කෘතිය කුමක් ද?

(ආ) කෘතියේ කතුවරයා කවුද?

(iii) මිනිස් හට සොඳුරු ගුණ සහ නුගුණ ඇත
නිදොස් කෙනෙකු මෙදියත උපදනේ නැත
වෙසෙස් සිනිඳු මුවරද බර **සහස් පත**
කොරොස් නළින් යුතු වෙයි කටු පෙළිනි යුත

(අ) මුල් කවි පද දෙකේ අර්ථය ලියන්න.

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන් වෙන්ව ලියන්න.

(iv) පෙර දිග ගොරහැඩි රකුසෝ
මගේ ධ්‍යානය ඇයි කඩන්නේ

(අ) "පෙරදිග ගොරහැඩි රකුසෝ " යන්නෙන් අදහස් කළේ කුමක්ද?

(ආ) කවි පෙළ රචකයාගේ නම ලියන්න

(v) " එසේ වී නම් දෙවඟනන් ලබන නියාවට මේ තරම් ඇපත් ඇති බැවින් බඹසර හැසිරෙමි"

(අ) ප්‍රකාශය කාගේද? ප්‍රකාශය කරන අවස්ථාව කුමක් ද?

(ආ) මෙය ඇතුළත් කෘතියේ කතුවරයා ගේ නම ලියන්න. (ලකුණු 4 × 5 = 20)

(2) පහත දී ඇති කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්න උපයෝගී කර ගෙන රසාස්වාදයක් ලියන්න.

එක් යුගයක ජීවිතයේ සරතස නිවූ මා සුමිතුර
දුර හිඳිනා ඔබ දකින්න ආයෙමි දිගු කලකට පසු

බමන විදුලි පංකාවෙන් වා ගැබ කැළඹෙන හඩ මිස
එ සඳ ඔබේ මුව ග නැගණු සාද තෙපුල් නැසේ මට

මේසය මත ලිපි ගොනු රැස සුළඟ නො යාදී රකිමින්
ඒ මත හිඳිනා ගල සේ මා අබියස නිහඩය ඔබ

බිත්තියේ ඇති සේයා රූ එකිනෙක එබී එබී බලයි
නැතියෙන් ඔබෙ වත හසරැලි මදෙස බලා සිනා නගයි

බාලේ අපි ගම් දොර කෙළි මඬුලු මැදින් ආ ගමනේ
මහදේ ඇඳි ඔබෙ සිතුවම කොහි සැඟවිණි දැයි නොදැනේ

එක් යුගයක ජීවිතයේ සරතැස නිවූ මා සුමිතුර
ඔබ අසලින් බැහරට යම් කුමට ද ඔබගේ අවසර

(i) කවි පෙළ සඳහා කවියා යොදා ගෙන ඇති අත්දැකිම කුමක් ද?

(ii) තම අත්දැකීම ඉදිරිපත් කිරීමට රචකයා යොදා ගෙන ඇති ආකෘතිය කුමක් ද? එය කොතෙක් දුරට ගැළපේ ද?

(iii) කවි පෙළ රසවත් කරලීමට යොදාගෙන ඇති කාව්‍ය උපක්‍රම 2ක් ලියා දක්වන්න ?

(iv) මෙම කවි පෙළ පිළිබඳ කෙටි ඇගයීමක් කරන්න.

(v) කිවිඳිය තම නිර්මාණයට ඉවහල් කර ගත් භාෂාව කොතෙක් දුරට එහි සාර්ථකත්වයට බල පා ඇති ද?

(ලකුණු 5 × 5 = 25)

## II කොටස

(3) පහත දැක්වෙන ගද්‍ය - පද්‍ය කොටස් දෙකින් **එක** කොටසකට පමණක් පිළිතුරු සපයන්න.

එබස් අසා බිසෝ බියපත්ව " පුත, ස්ත්‍රීහු නම් නොයෙන් වංචා දනිති" යනාදින් අවවාද කියා දී මඟදි අනුභවකරන පිණිස අනඟි රසයෙන් යුත්ත වූ රාජභෝජනය රන්මුඩමක පුරා දුන්හ. ඒ සඳ මහා බෝධි සත්ත්වයෝ මෑණියන් තුන්යලක් පැදකුණු කොට පසඟ පිහිටුවා වැඳ "ජීවත්ව උනිම් නම් සැපසේ අවුත් දකිනෙම් වේ දැයි කියා අවසර ඉල්වාගෙන ශ්‍රී යහන් ගබඩාවට වැද දුනු මුගුරු කඩු කොන්තසොටි යන පඤ්චා යුධ සන්නද්ධව ගෙන බත් මුඩම හා සමඟ කහවනුදහසකුත් පයියෙහි ලා ගෙන කොක නද නම් වීණාව අතින් ගෙන නුවරින් පිටත්ව මගට පිළිපන්ව මහත් වූ බල වීර්ය ඇති මහා බෝධිසත්ත්වයෝ එදවස් දාවල් බතට පනස් යොදුන් මග ගෙවා ගෙන ගොස් බත අනුභව කොට පස්වරුභාගයෙහි තුබූ පනස් යොත්න ගෙවා ගොස් සවස් වේලෙහි පැන්සනහා සාගල නුවරට වන්හ. බෝධි සත්ත්වයන් එනුවරට වන් කෙණෙහිම ප්‍රභාවතී උනස්නෙහි ඉඳ නොහී යහනෙන් බිමට බැසපුව එකල නුවරට වැද විඩාපත්ව යන්නා වූ බෝධිසත්ත්වයන් දැක එක්තරා ස්ත්‍රියක් තමාගේ ගෙට කැඳවාගෙන ගොස් ඉඳිනා අසුන් දී පයසෝධවා සැතපී හුන් කල්හි බත්මාළු සපයා අනුභව කරවූ ය. එ සඳ සතුටු වූ මහාබෝධිසත්ත්වයෝ රන්මුඩම හා සමඟ මසුදාස ඒ ස්ත්‍රියට දී ගෙනගිය පඤ්චායුධ එම ගෙයි තබා "මා ගොස් ආයුතු තැනක් ඇතැයි කියා වීණාව අතට ඇරගෙන ඇත්හළට ගොස් මේ රාත්‍රියෙහි සැතපෙන තෙනක් දෙවූ නම් තොපට වීණා ගායනා කෙරෙමි" කියා ඇත් ගොව්වන් විසින් අනුදක්නා ලදුව එක් තෙනක වැදහෙව මඳක් නිදා පිබිද ගමන් විඩා සන්සිඳුවා ගෙන වීණාව තත් සරහා සියලු නුවරවාසී සත්ත්වයෝ මේ අසත්ව යි සිතා ගී කියමින් වීණ ගායනා කරන්නාහ.

(i) "පුත , ස්ත්‍රීහු නම් නොයෙක් වංචා දනිති" යනුවෙන් ප්‍රකාශ කිරීමට හේතුව කුමක් විය හැකි ද?

(ලකුණු 5 )

(ii) මා ගොස් ආ යුතු තැනෙක් ඇතේ යි යනුවෙන් අදහස් කළේ කොහේද? (ලකුණු 5 )

(iii) ජේදයෙහි කියවෙන ආකාරයට කුස රජතුමාගේ චරිතයෙහි නිරූපණය වන යහපත් ගුණය කුමක්දැයි ලියා දක්වන්න (ලකුණු 5)

(iv) තම බිරිඳ රැක ගැනීමට අභිංසක උත්සාහයක යෙදෙන සැමියෙකු අපට මෙහිදී කුස රජු ගේ ක්‍රියාවන්ගෙන් දැකගත හැකිය. මේ පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 25 යි.)

<u>නැතහොත්</u>

වැහි වලා කුළ පෑ කළු යැයි ඔබේ
නො හොබිති යි කිසි ලෙස් නො සතොස් නොවන්
සිරුර පැයෙනු ගත් සුදනෝ ලොවේ
නො හඳුනත් උතුමන් ගුණයෙන් විනා

පැන නැඟී අහසේ පැතිරී ගොසින්
මහ ගිමන් සිඳුවා සත සිත් තොසින්
කුඹුරු - වැව් - පොකුණුත් පුරවා දියෙන්
ලොවට දෙන්නා ඔබයි අහරත් පැනුත්

නද අසා ඔබ ගේ පැහැයත් බලා
මොනරු පිල් විදහා රඟ දෙත් නදින්
අමුතුයෙන් පණවත් බව ලත් සෙයින්
තුරු ලියත් ලිය-ලයි සැනසී දියෙන්

සුදු වළාකුළු බෝ මැ අහස් කුසේ
ඉහළයෙයි ඔබ යැම පහත්වැ මැයි
එ පුදුමෙක් ද? උසස් නැණවත් දනෝ
ගුණ බරින් නැමුණෝ'වි පවතිත් නිතින්

කටට ගැන්මද බෝමැ අමාරු වූ
කර දියත් ඔබ ගත් කලැ සාගරෙන්
මිහිරි වෙයි උතුමන් සහ වාසයෙන්
නිවටයෝ ද උසස් වෙති බෝ සෙයින්

ගුණ බලා ඔබගේ ලො සබා දහම්
'ඔබැ' ර. අන් කිසිවෙක් නිසි නැ' කියා
විදුලියත් පැහැ පත් රන දම් සෙයින්
පළඳවන්නෙ ඔබේ ගෙලෙ මැ යි බලන්.

(i) කවි පෙළෙන් රචකයා ඉදිරිපත් කරන අත් දැකීම කුමක් ද? (ලකුණු 05)

(ii) කවියා තම අත්දැකිම ගෙන හැර දැක්වීමට උපයුක්ත කර ගත් භාෂාව ගැන පැහැදිලි කරන්න (ලකුණු 05)

(iii) ඔහු යොදා ගෙන ඇති කාව්‍යෝක්ති දෙකක් උදාහරණ මගින් පෙන්වා දෙන්න (ලකුණු 05)

(iv) කවි පෙළ මගින් සමජයේ දක්නට ලැබෙන විවිධ ගුණ හා නුගුණ කවියා සහෘදයා වෙත ඉදිරිපත් කරන ආකාරය පිළිබඳව විමසිමක් කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 25)

## III කොටස

- **ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු ලියන්න. (පිළිතුරක වචන 150 ක් වත් තිබිය යුතුය.)**

(4) දීර්ඝ ලෙස විස්තර කළ යුතු කරුණු උපමා මගින් ඉදිරි පත් කිරීම ධර්ම සේන හිමියන්ගේ කතා කලාවේ සුවිශේෂ ලක්ෂණකි නන්ද වස්තුව ඇසුරෙන් නිදසුන් තුනක්වත් දෙමින් විස්තර කරන්න

(ලකුණු 15)

(5) "තුංමංහන්දිය නවකතාවේ ඉස්මතු වී පෙනෙන නවකතාවක ඇතුළත් විය යුතු ලක්ෂණ නිදසුන් සහිතව විමසන්න. (ලකුණු 15)

(6) "සුභාෂිත කතුවරයා තම උපදේශ පැහැදිලි කිරීම සඳහා සත්ත්ව චරිත හා ඒවායේ ක්‍රියාකාරකම් යොදා ගෙන තිබේ" නියමිත කවි තුනක් යොදා ගනිමින් ඉහත කියමන පැහැදිලි කරන්න. (ලකුණු15)

(7) ගැමි ජනයාගේ විවිධ ජීවන වෘත්තීන් හා බැඳුණු අත්දැකීම් ජන කවියාට වස්තු විෂය වී තිබේ. නියමිත කවි තුනක්වත් ගනිමින් මේ කරුණු විමසන්න (ලකුණු 15)

## පිළිතුරු පත්‍රය - I කොටස

(1) (i) (අ) සීලවතී බිසව / කුස රජුගේ මව
(ආ) ඇත් ගොව්වකු ලෙස නුවර පැදකුණු කරන අවස්ථාවේ දී

(ii) (අ) දුප්පතුන් නැති ලෝකය
(ආ) ජී.බී. සේනානායක මහතා

(iii) (අ) මිනිසුන් තුළ යහපත් හා අයහපත් ගුණ ඇත. නිර්දෝෂී අයෙකු මෙලොව උපදින්නේ නැත.
(ආ) මුව රද - මල් පැණි
(ඇ) සහස් පත - නෙළුම් මල

(iv) (අ) නැගෙනහිරින් හිරු පායන අවස්ථාව.
(ආ) සිරි ගුණසිංහ මැතිතුමා

(v) (අ) නන්ද තෙරුන් වහන්සේ
(ආ) ජන පද කල්‍යාණිය යහපත් දැයි විමසන අවස්ථාව
(ඇ) දිව්‍ය ලෝකයේ දී
(ඈ) ධර්ම සේන හිමි

(2) (I) කුඩා කල සිට මිතුරන්ව සිටි දෙදෙනෙකුගෙන් එක් අයෙකු දිසාපති වේ ගමේ රැඳුන මිතුරා කලකට පසු ඔහු බලන්නට ගොස් ගණනකට නො ගැනීම උසස් තනතුරු ලැබීමෙන් මිනිසුන් වෙනස් වීම ගැන .

(ii) දෙපද ආකෘතිය
අත්දැකීම සඳහා වඩාත් ගැළපෙන බව කිව යුතුය

(iii) ව්‍යවහාර භාෂාව හා සම්භාව්‍ය පද්‍යයේ එන භාෂාව යොදා තිබීම
සංකේත භාවිතය.
උපමා භාවිතය යනාදිය

(iv) රසාස්වාදය සංක්ෂිප්තව කර ඇත්නම් නියමිත ලකුණු පිරිනමන්න

(v) කථකයාට ගැළපෙන බව, රූපකාර්ථවත් බව, වසං ග්‍යාර්ථවත් බව

## පිළිතුරු පත්‍රය - II කොටස

(3) (i) ස්ත්‍රීන් පිළිබඳ පැරණි මතය එනම් මායම් දන්නා බව සනාථ කිරීම නිසා සීලවතී බිසව කාන්තාවක් නිසාත් දුර දක්නා නුවණින් යුතු නිසාත් වැනි ගැළපෙන පිළිතුරක් සලකා ලකුණු දෙන්න .

(ii) මද්‍ර රජතුමාගේ නුවරට / ප්‍රභාවතී ඉන්නා තැනට.

(iii) පරිත්‍යාගශීලි බව.
කළගුණ සැලකීම.

(iv) කරුණු තේරුම් අරගෙන ලියා ඇති පිළිතුරුවලට ගැළපෙන ලකුණක් පිරිනමන්න

**නැතහොත්**

(i) යහපත් ගුණ හා අයහපත් ගුණ වැහිවලාකුළක් වන සුදු වලාකුළක් උපමාවලට යොදා ගනිමින් ඉදිරිපත් කිරීම.

(ii) හෙළ හවුලේ කවියෙකු නිසා ඇ කාරය යොදා ගැනීම.
වියත් වහර සම්මිශ්‍රණ වීම.
රූපකාර්ථවත් බව
සංවාදශීලී බව.

(iii) කරුණු ප්‍රශ්නයට ගැළපෙන බව සලකා ලකුණු ලබා දෙන්න

(iv) ගැළපෙන කරුණු ලියා ඇත්නම් නියමිත ලකුණු ලබා දෙන්න.

## පිළිතුරු පත්‍රය - III කොටස

ප්‍රශ්න අංක 4, 5, 6, 7 ප්‍රශ්නවලට අදළව පිළිතුරු ලියා ඇතිනම් ගැළපෙන පරිදි ලකුණු පිරි නමන්න.